මීට අමතරව 2020.06.03 දින විශේෂ සාකච්ඡාවක් අධ්‍යක්ෂ ජනරාල් තුමන් සමඟ පැවති අතර එහිදී ද ඔබ වෙනුවෙන් පහත සඳහන් ජයග්‍රහන දිනා දීමට හැකි විය.

1) 2017 වර්ෂයේ බඳවාගන්නා ලද නව නිළධාරීන් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම පිළිබඳව සාකච්ඡා කළ අතර එම විභාගය 2020 දෙසැම්බර් මස අවසන් වීමට පෙර පැවැත්වීමට කටයුතු කිරීමට එකඟ විය.

2) මාර්තු හා අප්‍රේල් මසට ලබාදුන් දීමනාව මැයි මසට අදාලවද ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට ඒකඟ විය

3) MN – 3 වැටුප් කාණ්ඩය අනුමත කර ගැනීම සඳහා කර තිබූ යෝජනාව යථාර්තයක් බවට පත්කර ගැනීමට මූලාරම්භයක් තැබීමට හැකිවීම. ( මෙම කාරණාව සම්බන්ධයෙන් කළමණාකරණසේවා දෙපාර්තමෙන්තුව සමඟ සාකච්ඡා කළයුතු බැවින් ඒ සඳහා ඉතා කඩිනමින් දිනයක් යොදාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.

4) ඉදිරිමස සිට ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා අවම වශයෙන් රු 2000 ක මාසික දීමනාවක් ලබා දියයුතු බවට කළ යෝජනාව සඳහා ඉදිරි කළමණාකරණ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගෙන රු 2000 හෝ අවම වශයෙන් 1500 ක මුදලක් ලබා දීමට කටයුතු කිරීමට එකඟ විය.

5) විශ්‍රාම ගිය නිළධාරීන් සඳහා විශ්‍රාම වැටුප ලැබෙන තෙක් විශ්‍රාම වැටුප ලැබීමෙන් අනතුරුව නැවත අය කර ගැනීමට යටත්ව රු 20000 ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරණ ලදී.එයද ඉදිරි කළමණාකරණ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට එකඟ විය.

6) බැංකු පරිඝණක ගත කිරීමට අදාල කටයුතු මේවන විට ඉතා මන්දගාමීව සිදුවන බැවින් ඉදිරි සති දෙක ඇතුලත කඩිනම් කිරීමට එකගතාවය පලකරණ ලදී.( මෙම ලිපිය ඔබ අතට පත්වන විට ඊට අවශ්‍ය කටයුතු ආරම්භකර තිබීමද සිදුවී තිබිය හැක.)

තවද කොවිඩ් 19 වෛරස් තත්වය පාලනය කිරීම වෙනුවෙන් ඇතිකළ ජනාධිපති කාර්ය සාධක බලකාය සමඟ සාකච්ඡා පවත්වමින් ඔබගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනීසිටීම ද සිදු කළ අතර එම නිසාම ඔබගේ ආරක්ෂාවට අවශ්‍ය මුඛ ආවරණ හා විෂබීජ නාශක දියර ලබාදීමට හැකි විය.

එසේම අප නිළධාරින්ගේ ආරක්ෂාව වෙනුවෙන් පසුගිය කාල වකවානුව තුල සිදුකරණ ලද රු 5000 ක දීමනාවට අදාල සියලුම ගෙවීම් ලේඛණ හා සියලු ගණුදෙණු පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමතකර තබාගන්නා ලෙසද සිහිපත් කරමි.

රටේ පවතින කොවිඩ් 19 පැරදවීම සඳහා ආරම්භ කර ඇති ඉටුකම අරමුදල සඳහා දායක වීම අප සැමගේ යුතුකමක් සේ සලකා මෙම අරමුලට දායක වීම සඳහා ක්‍රමවේදයක් සාකච්ඡා කළ අතර කිසිදු වෘත්තීය සංගමයකට මූලිකත්වය නොදී ප්‍රධාන කාර්යාලය හරහා වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කළා.ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ පවතින සුභසාධක සංගමයේ ගිණුම හරහා ක්‍රියාත්මක කිරීමට සාකච්ඡා කරණ ලදී.එම යුතුකම ඉටුකිරීම වෙනුවෙන් ඔබගේ දිනක වැටුප ඉටුකම අරමුදලට පරිත්‍යාග කිරීමට අවශ්‍ය කටයුත්ත සඳහා කිසිදු විරෝධතාවයකින් තොරව සිදුකර දෙන ලෙසට කාරුණිකව මෙයින් ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි.

**පුද්ගලික කටයුතු,දේශපාලන කටයුතු පසෙක තබමින් වෘත්තීය සංගමයක සැබෑ කාර්යභාරය ඉටුකරමින් කටයුතු කරණ අප සංගමය සමඟ අත්වැල් බැඳගනිමින් ඔබ අපගේ අනාගත ජයග්‍රහණ වෙනුවෙන් කටයුතු කිරීමට පෙළ ගැසෙන ලෙසට ද කාරුණිකව මෙයින් ඇරයුම් කර සිටිමු.**

ඉදිරියේදී අපගේ ක්‍රියාකාරකම් පිළිබඳව දැනුම්වත් වීම සඳහා සංගමයේ නිළ වෙබ්අඩවිය පරිශීලනය කරණ ලෙසට කාරුණිකව මෙයින් දන්වා සිටිමි. **( අපගේ වෙබ් ලිපිනය oisbku.com )**

**එකමුතුකම බලය වේ.එකට රොදබදිමු අයිතීන් ජය ගනිමු !!!!!**

---


සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු.අං..071-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු.අං.071- 4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු.අං.071-8191473